

## ක්‍රිස්තුදේව බාලිකාව ළඟ බන්ට් එක අවදානම්...

### වැලි කොට්ටවලින් තාවකාලික පිළියමක්

ගාල්ල - ලලිත් චාමින්ද සහ එස්. කේ. කළුආරච්චි, අහුංගල්ල - කමල ශ්‍රී ලියනගේ

ගිං ගඟ පහළ නිම්නයේ ජල මට්ටම ඊයේ (28 දා) උදෑසන වන විට වැඩිවෙමින් තිබූ අතර මෙම තත්ත්වය නිසා බද්දේගම ක්‍රිස්තුදේව බාලිකා විද්‍යාලය අසල ඇති ආරක්ෂිත (බන්ට) වේල්ල තුළින් බද්දේගම නගරයට ජලය කාන්දුවීම වැළැක්වීම සඳහා වැලිකොට්ට දමා එය වසා දැමීමට පියවරගෙන ඇති බැව් ගාල්ල හා මාතර දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු දීපිකා ත්‍රිමහවිතාන මහත්මිය සඳහන් කළාය.

## බද්දේගම වක්වැල්ල පාලමේ හිරවූ අපද්‍රව්‍ය ඉවත් කරන්න නාවික හමුදාව මැදිවෙයි

ගාල්ල - ලලිත් චාමින්ද සහ එස්. කේ. කළුආරච්චි

නාවික හමුදාව බද්දේගම වක්වැල්ල පාලමේ සිරවී ඇති අපද්‍රව්‍ය ඉවත් කිරීමේ මෙහෙයුම්වල නිරත වෙමින් සිටිති. ගාල්ල දිස්ත්‍රික්කයේ පෝද්දල සහ තෙලිකඩ යා කරන වක්වැල්ල පාලමේ යට කොටසේ පැවැති ගංවතුර තත්ත්වය හේතුවෙන් මේ වන විට විශාල වශයෙන් අපද්‍රව්‍ය සහ දැව කඳන් සිරවී ජලය බැස යෑමට නොහැකි තත්ත්වයට පත් වී ඇත. එම හේතුව නිසා පෙරේදා (27 දා) රාත්‍රි වන විට ගිං ගඟේ ජල මට්ටම ඉහළ යෑම හේතුවෙන් බද්දේගම අවට ප්‍රදේශයට තවදුරටත් ජල ගැලීමේ අවදානමක් පැවතිණි.

මෙම අවදානම් තත්ත්වය සැළවූ විගස ශ්‍රී ලංකා නාවික හමුදා විශේෂ යාත්‍රා බලඝණයට සහ මැරීන් බළකායට අනුයුක්ත නාවික නිලධාරීන් 73 දෙනෙකු එම ස්ථානය වෙත කඩිනමින් පිටත් කර යැවීමට නාවික හමුදාව කටයුතු කළේය.

